**තේ ශක්ති අරමුදල - 2016**

**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

තේ ශක්ති අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ , 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට හෝ සෑම වසර 3 ක් හෝ 5 ක් තුළ එම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවද අරමුදලේ ස්ථාවර වත්කම් 2006 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | තේ ශක්ති අරමුදල 2008 සිට 2016 වර්ෂය සඳහා අඛන්ඩව අලාභදායි තත්ත්වයෙන් පවත්වාගෙන යාම මත ආයතනයේ පැවති කාරක ප්‍රාග්ධන ගැටළු නිසා ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නොහැකි වී ඇති නමුත්, මේ වනවිට අදාළ කාර්යය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.ඒ අනුව, ඇතැම් කර්මාන්තශාලාවල තක්සේරු වාර්තා මේ වනවිට ආයතනය වෙත ලැබී ඇත. | තක්සේරු වාර්තා පදනම් කරගෙන වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 68 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ අයිතමයන් විකුණා බැහැර කිරීමේදී ඇතිවන වාසිය හෝ අවාසිය මූල්‍ය වර්ෂයේ ලාභය හෝ අලාභයට ගැලපිය යුතු වේ. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අරමුදල සතු ධාරණ අගය ශූන්‍ය වූ වාහන 04 ක් රු. 6,761,400 කට විකුණා තිබූ අතර එම විකිණීමෙන් ලද ලාභය, උක්ත පරිදි ගැලපීමෙන් තොරව මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ වෙළඳ හා වෙනත් ගෙවියයුතු දෑ ලෙස ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම එම වාහන 04 ඇතුලු වාහන 05 ක පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් හා මූල්‍ය ප්‍රකාශ සඳහා වූ උපලේඛනවලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | අදාළ නිවැරදි කිරීම 2017 වර්ෂයේ ගිණුම් වාර්තා මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කොට ඇත. | දේපළ පිරියත හා උපකරණ අයිතමයන් විකුණා බැහැර කිරීමේදී ඇතිවන වාසිය හෝ අවාසිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ගැලපිය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල සතු නොවූ වාහන 37 ක් අරමුදලේ ස්ථාවර වත්කම් ලේඛණයට හා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ අතර 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා ක්ෂය වෙන් කර තිබුණි. එයින් වාහන 17 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් කර තිබූ අතර ඉතිරි වාහන 20 සඳහා සමාලෝචිත වර්ෂයේ දී ක්ෂය වෙන්කිරීම් රු.95,250 ක් වූ අතර ඒ අනුව වර්ෂයේ අලාභය රු.95,250 කින්ද රඳවාගත් ඉපයුම් වල හර ශේෂය රු.20,346,301 කින්ද අධිගණනය වී තිබුණි. | තේ ශක්ති අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ කුඩා තේ වතු හිමියන් නඟා සිටුවීම වන අතර, එම අරමුණින් කුඩා තේ වතු සමිති වෙතින් තේ දළු එකතු කර තේ ශක්ති කම්හල් වෙත දළු සැපයීම සිදු කිරීම සඳහා සහ කුඩා තේ වතු සංවර්ධන සමිති බල ගැන්වීම සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති කල් බදු ලීසිං පහසුකම් මත මෙම වාහන මිලදී ගෙන ඇත. | අරමුදල සතු වත්කම් පමණක් ස්ථාවර වත්කම් ලේඛණයට හා මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | තේ ශක්ති අරමුදලේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු බත්තරමුල්ල පැලවත්තෙහි පිහිටි ඉඩමක් මිලදී ගැනීමට 2010 මාර්තු 31 දින රු.8,082,256ක අත්තිකාරම් මුදලක් අධිකාරිය වෙත ගෙවා තිබුණද එම ඉඩමේ සම්පූර්ණ වටිනාකම නොගෙවීම හේතුවෙන් අධිකාරිය විසින් 2016 ජූලි 07 දින රු.7,000,000ක් තේ ශක්ති අරමුදල වෙත ආපසු ගෙවා තිබුණි. එසේ වුවද, අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු නොකර ආපසු ලැබුන රු.7,000,000ක මුදල අවිනිශ්චිත ගිණුමට බැර කර ගෙවූ රු.8,082,256ක් ලැබිය යුතු අත්තිකාරම් ලෙස වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් අරමුදලේ වත්කම් හා වගකීම් රු.7,000,000කින් අධිගණනය වී තිබුණි. | අදාළ නිවැරදි කිරීම 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කොට ඇත. | අත්තිකාරම් නිරවුල් කිරීම නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | පස්සර තේ ශක්ති කම්හලේ වියදම් පියවා ගැනීම සඳහා ලබා ගෙන තිබුණු රු.2,000,000ක බැංකු අයිරාව, මූල්‍ය ප්‍රකාශනය තුළ නිවැරදිව වර්ගීකරණය නොකර ජංගම වගකීම් යටතේ වූ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් අවිනිශ්චිත ගිණුමේ අතුළත් කර තිබුණි. | අදාල නිවැරදි කිරීම 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කොට ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි වර්ගීකරණයන් යටතේ ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2015 වර්ෂයේදී ගෙවන ලද, 2016 වර්ෂයේ මාස 6කට අදාල රක්ෂණ වාරික වටිනාකම වූ රු.5,993,437ක් 2016 | අදාල නිවැරදි කිරීම 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පෙර වර්ෂයේ |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට ද අනෙකුත් ලැබිය යුතු දෑ තුළ දක්වා තිබීමෙන් අරමුදලේ වත්කම් හා බැරකම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | | ඉදිරියට කරන ලද ගෙවීම් සැලකිල්ලට ගත යුතුය. |
| (ඉ) | තේ ශක්ති අරමුදලේ යටිනුවර, පොතුපිටිය හා බුලත්කොහුපිටිය කම්හල් ඉදිකිරීමට පුද්ගලික ආයතනයක් වෙත 2001 වර්ෂයේදී රු.28,311,751 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට අත්තිකාරම් ලබා දී වර්ෂ 15 කට වැඩි කාලයක් ගත වී තිබුණද අත්තිකාරම් නිරවුල් කර ගැනීමට හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ තැන්පතු හා අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟයි. | කම්හල් ඉදිකිරීමට අත්තිකාරම් ලබාදී වර්ෂ 15 කට වැඩි කාලයක් ගත වී ඇති බැවින් අත්තිකාරම් නිරවුල් කර ගැනීමට හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්තශාලා 4ක හිඟ තේ තොග වටිනාකම රු.7,902,517ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. එම හිඟ තේ තොග සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලාභ අලාභ ගිණුමේ පාඩු ලෙස හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව පරීක්ෂණ ආරම්භ කර ඇත. එම නිලධාරීන් සේවයෙන් ඉවත්වී යාම, ඇතැම් නිලධාරීන් මිය යාම වැනි කරුණු මත අදාළ වටිනාකම් අයකර ගැනීමට අපොහොසත් වී ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි 2.2.3 ප්‍රකාරව හානි සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර මහා භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|---|
| උත්සව අත්තිකාරම් හා වෙනත් අත්තිකාරම් (වසර 7කට වඩා වැඩි) | 903,912 | 264,733 | 639,179 | 2017 වර්ෂයේ ගිණුම් වාර්තා මඟින් අදාළ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | කම්හල් ගිණුම් යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 92,703,191 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා | 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා සමඟ විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණය කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| නිමි තේ සහ පොහොර තොග | 4,387,922 | තොග සමීක්ෂණ වාර්තා | 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා සමඟ විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | වර්ෂය අවසානයට තොග සමීක්ෂණය කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ | 271,543,470 | ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ | 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා සමඟ විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | ලැබිය යුතු ශේෂ තහවුරු කර ගැනීම සඳහා අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 318,946,968 | ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ | 2017 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා සමඟ විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | සියළුම ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ ශක්ති අරමුදලේ මැදිහත් වීමෙන් කුඩා තේ වතු සමිති වෙත කල්බදු ක්‍රමයට ලබාගෙන තිබුණු වාහන 13ක් සඳහා කල්බදු වාරික ලෙස 2001 හා 2002 වර්ෂවලදී රු.2,691,326 ක් තේ ශක්ති අරමුදල විසින් ගෙවීම් කර තිබූ අතර එය | අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ කුඩා තේ වතු හිමියන් නඟා සිටුවීම වන අතර, එම අරමුණින් කුඩා තේ වතු සමිති වෙතින් තේ දළු එකතු කර තේ ශක්ති කම්හල් වෙත දළු සැපයීම සිදු කිරීම සඳහා සහ කුඩා තේ වතු සංවර්ධන සමිති බල ගැන්වීම සඳහා කුඩා තේ වතු සංවර්ධන | කුඩා තේ වතු සමිති වෙනුවෙන් ගෙවන ලද කල්බදු වාරික, අරමුදලට ආපසු අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටද මෙම ශේෂය අයකර ගැනීමට අරමුදලට නොහැකි වී තිබුණි. මෙම ලැබීම් අවිනිශ්චිතව පැවතියද ඒ සඳහා ප්‍රතිපාදනයන් සිදු කිරීමටද අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | සමිති කල් බදු ලීසිං පහසුකම් මත මිලදී ගත් වාහන සඳහා අදාළ කල් බදු වාරික මුදල් තේ ශක්ති අරමුදල මගින් 2000 සහ 2001 වසර වලදී දරා ඇත. එම කල්බදු වාරික නැවත අයකර ගැනීමේ අරමුණින් එසේ සිදුකර ඇති අතර, පසුව එම සමිති මගින් තේ ශක්ති කම්හල් සඳහා දළු සැපයීම අඩාලවීම මත එම මුදල් අයකර ගැනීමට තේ ශක්ති අරමුදලට නොහැකිවී ඇත. එමගින් අදාළ ශේෂය ගිණුම් වාර්තාවල 2002 වසරේ සිට ඉදිරියට රැගෙන එනු ලැබේ.<br>ඉදිරියේදී මෙම වත්කම් නැවත අයකර ගැනීමට හැකියාව නොමැති බැවින්, කපා හැරීමට කටයුතු යොදනු ඇත. | නොහැකි වී ඇති බැවින් එම ශේෂය සඳහා විධිමත් පියවරක් ගත යුතුය. |
| (ආ) | 2008 වර්ෂයේ සිදුව තිබූ රු.1,548,354ක මූල්‍යමය පාඩුවක් වගකිව යුතු පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වර්ෂ 08ක කාලයක සිට වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මේ සඳහා වගකිව යුතු නිලධාරියා මියයාම මත අදාළ මූල්‍යම පාඩුව අයකරගැනීමට නොහැකි වී ඇත. | මෙම මූල්‍යමය පාඩුව සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.2,957,414ක විවිධ ණයහිමි ශේෂයක් පැවතියද එම ණයහිමියන් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | ණයහිමියන් හඳුනාගෙන එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | නිකුත්කරන ලද ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වල වලංගු කාලය එනම් මාස 06 | අදාළ නිවැරදි කිරීම 2017 වර්ෂයේදී සිදු | කල් ඉකුත් වූ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | ඉක්මවූ චෙක්පත් වලංගු කර නැවත ආදායකයා වෙත යැවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට මාස 8 සිට මාස 26 දක්වා කල් ඉකුත් වූ බැංකුවට ඉදිරිපත් නොකළ රු.213,500ක් වටිනා චෙක්පත් 11ක් සම්බන්ධව යොමු ගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කිරීමට කටයුතු කර ඇත. | සම්බන්ධයෙන් යොමු ගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේ 2022 සැප්තැම්බර් 06 වන අතර 2023 දෙසැම්බර් 18 වන විටත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ අදාළ වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2015 ඔක්තෝබර් 23 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2015 චක්‍රලේඛයේ 02 වන ඡේදය | අක්‍රීය නිල බැංකු ගිණුම් වැසීමේදී චක්‍රලේඛයේ ආකෘති පත්‍ර අංක TOD /BA /03 නිවැරදිව සම්පූර්ණ කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම කළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අක්‍රීයව පැවති බැංකු ගිණුම් 03 ක් වැසීමට කටයුතු කර තිබූ නමුත් අරමුදල විසින් නියමිත ආකෘති පත්‍ර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | තේ ශක්ති අරමුදල ආරම්භක අවස්ථාවේදී තේ ශක්ති අරමුදලේ කොටස් නිකුත් කිරීමේ කටයුතු වෙනුවෙන්, තේ ශක්ති විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කළමනාකරණ කම්හල් ව්‍යාපෘතිය සඳහා ආරම්භ කර තිබූ ජංගම ගිණුම් 03 අදාළ ව්‍යාපෘති 2002 වසරේ අවසන්වීම සහ අක්‍රීය වීම මත අදාළ ගිණුම්වල ගනුදෙනු එම වර්ෂවල සිට සිදුව නොමැත. ඒ අනුව 2019.06.14 දින අදාළ ජංගම ගිණුම් වසා දමා ඇත. | වසා දමා ඇති ගිණුම් වලට අදාළව චක්‍රලේඛය ප්‍රකාරව නියමිත ආකෘති පත්‍ර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,529,438 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 39,232,291ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,702,853 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් රු.108,496,158 කින් වැඩිවීම, පොලී වියදම් හා විකුණුම් හා බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු. 18,124,409 කින් හා රු.14,928,507 කින් අඩු වීම සහ පොලී ආදායම රු.193,599 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාත 1:1 ක් වූ අතර පෙර වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 1:1.06 ක් හා 1:0.85 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව තොග ශේෂය සියයට 94කින් අඩු වී තිබීම අනුපාතයන්හී වෙනස් වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට තේ ශක්ති අරමුදල විසින් විදුලි සම්බන්ධතාවය නැවත ලබාගැනීමේ ගාස්තු, සේවක භාරකාර අරමුදල සඳහා අධිභාර ගාස්තු සහ සේවක නඩු සඳහා දඩ මුදල් ලෙස පිළිවෙලින් රු.154,392ක්, රු.109,342ක් හා රු.80,500ක් ලෙස එකතුව රු.344,234ක් අනාර්ථිකව වැය කර තිබුණි. | තේ ශක්ති අරමුදලේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් අදාළ ගෙවීම් ප්‍රමාද වීම මත අධිභාර ගෙවීමට සිදුවී ඇති අතර තේ ශක්ති තේ කර්මාන්තශාලා වැසීයාම හේතුවෙන් කම්කරුවන් හට සේවය ලබාදීමට නොහැකි වීම නිසා එම කම්කරුවන් කළ පැමිණිලි වෙනුවෙන් අදාළ වන්දි මුදල් ගෙවීමට සිදුව ඇත. | අරමුදලේ වියදම් ප්‍රමාද වීමකින් තොරව නියමිත පරිදි නියමිත දිනට ගෙවීම් කිරීම තුළින් අනාර්ථික ගෙවීම් වළක්වා ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | හොරණ පොහොර ගබඩාව සහ ඇල්පිටිය,හිනිදුම,රයිගම් කෝරලය හා පස්සර තේ කම්හල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අරමුදල විසින් රු.81,036,209ක් වැයකර තිබුණද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල අයිතිය අරමුදල සතුව නොපැවතුණි. | අදාළ ඉඩම් තේ ශක්ති අරමුදල වෙත පවරා දීම සඳහා ඉඩම් අයිතිය හිමි ආයතනවල ලිඛිත එකඟතාව මත තේ ශක්ති අරමුදලේ ප්‍රතිපාදන මඟින් ගොඩනැගිලි ඉදි කොට ඇත. ඒ අනුව, අදාළ ගොඩනැගිලි ඉදිකිරීමේ පිරිවැය ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇත. ඉඩම පවරා ගැනීමට අදාළව මූලික කටයුතු අරඹා ඇත. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 ජූලි 13 දිනැති අංක අමප/16/1224/726/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාල මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අංක 04 ප්‍රකාරව, කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීම හා සුභසාධන රක්ෂණ අරමුදලින් කර්මාන්තශාලාවල කටයුතු සඳහා යෙදවූ රු. මිලියන 135 ක මුදල ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අනුව කම්හල් බදු දීමෙන් ලැබෙන ආදායමෙන් කොටසක් අරමුදල වෙත ලබාදීම සිදුකළ යුතු වුවද සුභසාධන අරමුදල වෙත එම මුදල් බැර කිරීම මේ දක්වා සිදුකර නොතිබුණි. | තේ ශක්ති අරමුදල මඟින් ක්‍රියාත්මක කළ සුභ සාධන අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම පමණක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් තේ ශක්ති අරමුදල මඟින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ලබාදෙන අතර, සුභ සාධන අරමුදල වෙනුවෙන් රැස් කර ඇති මුදල එම අධිකාරිය වෙත පැවරීමට තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී නොමැත. තේ ශක්ති අරමුදල මඟින් භාවිතා කර තිබූ එම මිලියන 135 ක මුදල බදු හා කළමනාකරණ ආදායමින් රැස් කර තබා ගැනීමට පමණක් අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා සියලුම කම්හල් ඒකාබද්ධව ගිණුම් සැකසීම සඳහා වටිනාකම රු.2,435,000ක් වූ පරිසනක මෘදුකාංග පද්ධතියක් 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් සැකසීමේ කටයුතු සඳහා එම මෘදුකාංගය භාවිතා කර නොතිබුණි. | අදාළ පරිසනක දත්ත පද්ධතිය අන්තර්ජාලය හරහා (Online) ක්‍රියාත්මක කිරීමට සකස් කර තිබූ අතර ඇතැම් කර්මාන්තශාලා පිහිටීම අනුව ජාලගත කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. | පරිසනක මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීමට පෙර අවශ්‍ය පහසුකම් සැලසුම් කළ යුතු අතර මිලදීගත් පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ගැනී මට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ ලබාදෙන ලද 2016 ජූලි 13 දිනැති අංක අමප /16 /1224 /726 /015 – I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ප්‍රධාන කාර්යාලයේ ස්ථිර කාර්යය මණ්ඩලය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතනවල පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම සහ පුරප්පාඩු නොපවතීනම් අධි සේවක පදනම මත ඔවුන් වෙත විශේෂ වන සේ එම ආයතන සඳහා අනුයුක්ත කළ යුතු වුවද, රාජ්‍ය ආයතන 06 ක් වෙත අනුයුක්ත කර තිබුණු තේ ශක්ති සේවකයන් | ඉහත ආයතනවලට අනුයුක්තව සේවය කරන තේ ශක්ති අරමුදලින් වැටුප් ලබාගන්නා නිලධාරීන් ඒ ඒ ආයතනවල කාර්ය මණ්ඩලයටම ඇතුළත් කරගෙන එම ආයතනවලින් වැටුප් ගෙවීමට කටයුතු කිරීමට විධිවිධාන යොදා ඇත. මේ වන විට නිලධාරීන් 05 දෙනෙකු පමණක් තේ ශක්ති අරමුදලින් වැටුප් ලබාගනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| | 17 දෙනෙකු වෙනුවෙන් වැටුප් වශයෙන් රු.6,936,224 ක මුදලක් අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පසුවද අරමුදල විසින් ගෙවා තිබුණි. | | |
| (ඉ) | තේ ශක්ති අරමුදලට එරෙහිව සේවකයින් හා බාහිර පාර්ශවයන් විසින් කම්කරු විනිශ්චය සභාවේ නඩු 142ක්ද අභියාචනාධිකරණයේ එක් නඩුවක් ද ගොනුකර තිබුණු අතර තේ ශක්ති අරමුදල විසින් දිසා අධිකරණවල නඩු 14ක් ගොනුකර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වී ඇත. | අරමුදලට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් හේතු වූ කරුණු අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2016 ජූලි 13 දිනැති අංක අමප 16/1224/726/015-I සහ 2016 අගෝස්තු 17 දිනැති අංක අමප/16/1427/726/015-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව දෙනියාය, ගිලීමලේ, රයිගම් කෝරලේ සහ දැරණියගල යන තේ කර්මාන්තශාලා බදු පදනමට බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණි. එම එළඹ තිබුණු බදු ගිවිසුම්වල 07 වන වගන්තියේ සඳහන් පරිදි දේපල බදු ලබාගත් පාර්ශවයන් විසින් මාසික අමු දලු ධාරිතාවට සරිලන වටිනාකම් ප්‍රමාණයට තේ ශක්ති අරමුදල නමින් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගත යුතු නමුත් අරමුදල ඒ අනුව බදුකරුවන්ගෙන් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි. | මාසිකව දළු මිලේ පවතින උච්චාවචනයන් මත අදාළ මුදල තීරණය කිරීමේ අපහසුතාව හා කර්මාන්තශාලා බදු හා කළමනාකරණය බාහිර පාර්ශවයන් වෙත පවරන අවස්ථාවේදි තේ ශක්ති අරමුදල විසින් එම කර්මාන්තශාලාවල නිෂ්පාදනය නතර කර විශාල කාලයක් ගතවී තිබූ බැවින්, එම කර්මාන්තශාලාවල නව නිෂ්පාදන ආරම්භ කිරීම සඳහා බදු හා කළමනාකරණ ගැණුම්කරුවන් හට විශාල මුදලක් ආයෝජනය කිරීමට සිදුවීම වැනි ප්‍රායෝගික ගැටළු මත මෙම කොන්දේසිය ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇත. | ප්‍රායෝගික තත්වය පිළිබද අවධානය යොමුකර ගිවිසුම් සකස් කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | එළඹ තිබුණු බදු ගිවිසුමේ දෙවන ඡේදය ප්‍රකාරව රයිගම් කෝරලේ තේ ශක්ති කම්හල බදු ගැණුම්කාර පක්ෂය වන දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතියෙන් ආපසු ගෙවන තැන්පත් මුදලක් වශයෙන් මාස 06 ක බදු කුලිය වන රු.1,500,000 ක මුදල, තේ ශක්ති අරමුදල | දික්හේන කුඩා තේ වතු සංවර්ධන සමිතියේ ගිවිසුම් කාලය අවසන් වීමට ප්‍රථම කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගෙන නැවත නව කළමනාකරණ ගැණුම්කරුවකු වෙත මේ වන විට පවරා ඇත. | ගිවිසුම් කාලය අවසන් වීමට ප්‍රථම කම්හල නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගත්තද ගිවිසුම ප්‍රකාරව ආපසු ගෙවන තැන්පත් මුදල අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙත අයකරගත යුතු නමුත් 2021 වර්ෂයේදි බදු ගිවිසුම අවසන් වන විටද අරමුදල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | දෙනියාය තේ කම්හල බදු පදනම මත බාහිර පාර්ශවයක් වෙත ලබා දීමේදී බදු ගැණුම්කරු විසින් තැන්පත් කරන ලද ආපසු ගෙවියයුතු මාස 06 ක බදු මුදල් වූ රු.2,850,000 ක් 2016 දෙසැම්බර් 31 දින දක්වාම ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් තොරව ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ 2016.12.05 දින මුදල කම්හලේ බදු ගැණුම්කරු ශ්‍රීන්ලයින්ෆස්ට් සමාගම විසින් තැන්පත් කර ඇති අතර, 2017 වර්ෂයේදී ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. | මූල්‍ය වත්කම් උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි නිවැරදිව ආයොජනය කළයුතුය. |